# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/86 – 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා – 2023.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/208.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.05.09 දිනැති හා අංක 2331/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.04.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අහංගම, මිදිගම, ගම්මැද්ද, බදුරුප්ප පාර, දෙවනිය වත්ත හි පදිංචි එල්. චේතුක සමන්ත මයා සහ 1. කොළඹ 05, කිරුළ පාර, අංක 200 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, 2 හබරාදුව, කොග්ගල ඩිපෝව ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A/42/2023 හා 2023.11.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 041096 – 18 (2023/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

*ගොනු අංකය:* IR/COM/04/2020/208.
*බේරුම්කරණ නඩු අංකය* K/A/42/2023.

එල්. චේතුක සමන්ත,
දෙවනිය වත්ත,
බදුරුප්ප පාර,
ගම්මැද්ද,
මිදිගම,
අහංගම.

*පලමු පාර්ශ්වය*

එදිරිව

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
කොග්ගල ඩිපෝව,
හබරාදුව

*දෙවන පාර්ශ්වය*

**අතර කාර්මික ආරවුල සඳහා ප්‍රදානය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 දරන හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය ප්‍රකාරව තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාරේ අංක 117 හි පදිංචි සිරි සිංගප්පුලි වන මා පත්කොට ඇත.

**බේරුම් කළ යුතු කරුණු**

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ අංක IR/COM/04/2020/208 සහ 2023 අප්‍රේල් 18 දාතම සහිත යොමුවෙන් දක්වා ඇති පරිදි බේරුම් කළ යුතු කරුණු වනුයේ එල්. චේතුක සමන්ත යන අය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 111 පෙළ විදුලි කාර්මිකයෙකු වශයෙන් කොග්ගල ඩිපෝවේ සේවය කරමින් සිටියදී 2014.02.09 දින ඇති වූ සිද්ධියක් පදනම් කරගෙන පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව සේවයෙන් පහ කළද එම කරුණු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු විභාගයෙන් අනතුරුව නිදොස් කොට නිදහස් කිරීම හේතුවෙන් සේවය අවසන් කරමින් ලබා ඇති දඬුවම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

**පාර්ශ්වයන් වෙනුවෙන් පෙනී සිටීම**

අදාළ බේරුම්කරණ ක්‍රියාවලියේදී ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වය වෙනුවෙන් රැකවරණ නිලධාරි පී. එම්. තිලකසිරි යන අයද දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ශානිකා ගාල්ලගේ සහ නීතීඥ ඔෂිනි සේනාධිපති යන අය ද පෙනී සිටින ලදී.

**ආරාවුලේ පසුබිම**

පළමු පාර්ශ්වය 2023.06.15 දාතමින් ඉදිරිපත් කරන ලද සිය මූලික ප්‍රකාශයෙන් දක්වා තිබුනේ 1996.01.01 දින සිට ඉංජිනේරු කම්කරුවකු ලෙස තමා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවයට බඳවා ගන්නා ලද බවත් 2007.11.01 දින සිට කොග්ගල ඩිපෝවේ සේවයට පත්කරන ලද බවත් ඒ වන විට විදුලි කාර්මිකයකු ලෙස සේවය කරමින් සිටි තමා 2014.02.09 දින 20 පැයට වැඩ මුරය නිම කොට නිවස බලා ගිය බවත් ඉන් අනතුරුව 22 පැයට පමණ කොග්ගල ඩිපෝවේ ආපදා රථයෙන් පැමිණි එම ඩිපෝවේ රියැදුරකු සහ

ආරක්ෂක නියාමකවරයකු බස් රථයක විදුලි කාර්මික ආපදාවක් යථාවත් කිරීමට ඇති බව පවසා තමා කැඳවාගෙන ගොස් අනතුරුව හබරාදුව පොලිසියට භාරදුන් බවත්ය.

හබරාදුව පොලිසිය තමා ගාල්ල මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කොට සතියකින් පසු ඇප මත නිදහස් කළ බවත් ඉන් පසු නැවත කොග්ගල ඩිපෝවේ සේවය සඳහා පැමිණි බවත් එසේ සේවය කරමින් සිටියදී රුහුණු ප්‍රාදේශීය ආරක්ෂක අංශය විසින් තමාගෙන් ප්‍රකාශයක් ලබා ගත් බවත් ඉන් අනතුරුව වේතන රහිතව සිය සේවය තහනම් කරන ලද බවත් දක්වා ඇත.

ඉන් පසු තමා වෙත චෝදනා පත්‍රයක් නිකුත් කළ බව සහ අනතුරුව විනය පරීක්ෂණයක් සිදුකර සියලු චෝදනාවන්ට වැරදිකරු බවට තීරණය කළ බවත් එම විනය නියෝගයේදී තමාට අසාධාරණයක් සිදුවූ බවට කරුණු දක්වමින් අභියාචනයක් ඉදිරිපත් කළද යම් පළිගැනීමක් මත එය නිෂ්ප්‍රභ කරණ ලද බවත් තවදුරටත් සඳහන් කර තිබේ.

මේ සම්බන්ධයෙන් ගාල්ල මහේස්ත්‍රාත් උසාවියේ පැවති නඩු විභාගයෙන් තමා නිදොස් කොට නිදහස් කළ බවත් එම කරුණු මත පිහිටා තමාට යළි රැකියාව ලබා දෙන ලෙස ගමනා ගමන මණ්ඩලයේ සභාපතිවරයා ගෙන් 2017.12.13 දින ඉල්ලා සිටියද තමාට රැකියාව ලබා නොදුන් බවත් අන් පිළිසරණක් නොලද හෙයින් කම්කරු කොමසාරිස්වරයා වෙත මෙය පැමිණිළි කර සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා සිටි බවත් දක්වා තිබේ.

දෙවන පාර්ශ්වය 2023 ජුනි 13 දින කම්කරු කොමසාරිස්වරයා වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් එහි ප්‍රථම වැකියෙන් දක්වා ඇත්තේ කාර්මික ආරාවුල් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව සේවයෙන් පහකළ දින සිට මාස 06 ක කාලයක් තුළ කම්කරු විනිශ්චය අධිකාරිය වෙත ඉල්ලුම්පත්‍රයක් ගොනු කිරීමට හිමිකම පැවතිය ද ඉල්ලුම්කරු එම නෛතික ක්‍රියාමාර්ගයට අනුගතව නොමැති හෙයින් ඒ අනුව තමා සේවයෙන් පහ කිරීමට එරෙහිව බේරුම් කරණය වෙත ඉල්ලීමක් යොමු කිරීමට අධිකරණමය බලයක් නොමැති මෙය මුල් අවස්ථාවේම නිෂ්ප්‍රභ කරන ලෙසය.

තවදුරටත් කරුණු දක්වන දෙවන පාර්ශ්වය පවසනුයේ ඉල්ලුම්කරු කොග්ගල ඩිපෝවේ සේවයේ යෙදෙමින් සිටියදී 2014.02.09 දින ස්ටාර්ටර් මෝටර ආම්චරයක් වංචනික ලෙස අනවසරයෙන් ඩිපෝ භූමියෙන් ඉවතට රැගෙන යාමට උත්සාහ දැරීමට අදාළව මූලික විමර්ෂණයක් පවත්වන ලද බවත් මෙය බරපතල විෂමාචාර ක්‍රියාවක් හෙයින් ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථා මාලාවේ ප්‍රතිපාදන මත ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කරන ලද බවයි.

ඉන් අනතුරුව චෝදනා පහක් සහිත චෝදනා පත්‍රයක් ඉදිරිපත්කොට පළමු පාර්ශ්වයට එරෙහිව අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වන ලද බවත් එකී චෝදනා සියල්ලට එම පරීක්ෂණයේදී වරදකරු වීම නිසා පළමු පාර්ශ්වය සේවයෙන් පහ කරන ලද බවත් එම විනය නියෝගයට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනය ද සළකා බැලූ අභියාචන මණ්ඩලය එය නිෂ්ප්‍රභ කොට පළමු දඬුවම එලෙසම ක්‍රියාත්මක කිරීමට 2014.10.01 දින අභියාචන නියෝගය නිකුත් කර ඇති බවත් දක්වා ඇත.

මීට අදාළව පොලිසිය මගින් ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩු විභාගයෙන් පළමු පාර්ශ්වය නිදොස් කොට නිදහස් කර තිබුනද මණ්ඩලය විසින් පවත්වන ලද අදාල විනය පරීක්ෂණයේදී වැඩි බර සාක්ෂි මත චෝදනාවන් සියල්ලටම ඉල්ලුම්කරු වරදකරු වීම මත සේවයෙන් පහ කරන ලද බවත් ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවීමට දෙවන පාර්ශ්වයට හැකියාවක් නොමැති බවත් තවදුරටත් දක්වා තිබේ.

**බේරුම් කරණ තීන්දුව ලබාදීමේදී සළකා බලා ඇති කරුණු**

පළමු පාර්ශ්වය අනවරතයෙන් තම රැකියාව බේරාගැනීමේ කාර්යයේ නිරතව සිට ඇති හෙයින් ඔහුගේ ඉල්ලීම නිෂ්ප්‍රභ කළ හැකි තත්වයක නැත.

පැමිණිලි පාර්ශ්වය ගොනු කර ඇති සාක්ෂි තහවුරු කරන්නට අපොහොසත් වීම නිසා මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවෙන් විත්තිකරු නිදොස් කොට නිදහස් කරමින් තීන්දුව ලබා දී ඇත. එම අධිකරණ තීන්දුව පිළිගැනීමට අසීරු වන්නේ නම් ප්‍රවීන නීති නිලධාරීන් සේවයේ යෙදී සිටින දෙවන පාර්ශ්වයට ඊට එරෙහිව ඉහළ අධිකරණයකට අභියාචනා කිරීමේ පහසුකම සහ අවස්ථාව පැවතියද එවැනි පියවරක් ගන්නට පෙළැඹී ඇති බව තහවුරු කර නැත.

2017.11.27 දින අධිකරණය ලබා දී ඇති නඩු තීන්දු වාර්තාව අමුනා තමා යළි සේවයේ පිහිටුවන ලෙස 2017.12.13 දාතම දරන ලියාපදිංචි ලිපිය යොමු කොට දෙවන පාර්ශ්වයෙන් හෙවත් ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපතිවරයාගෙන් පළමු පාර්ශ්වය ඉල්ලීමක් කර තිබේ.

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය හා ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලවලට අදාළ විනය ව්‍යවස්ථා මාලාවේ අංක 12 ට අනුව එහි සේවකයකුට කිසියම් විනය ක්‍රියාමාර්ගයකට එරෙහිව අභියාචනය කිරීමේ හිමිකම දක්වා ඇත.

එහි අංක 12. 2 යටතේ විනය නියෝගයකින් දඬුවම් ලැබූ සේවකයකු ඉහල අධිකරණයකට කරන ලද අභියාචනයකට පසු වැරදිකරු කිරීම හෝ දඬුවම් කිරීම ඉවත් කරනු ලැබුවහොත් විනය විභාගයේ කළින් ගත් තීරණය සමාලෝචනය කිරීම සඳහා එකී නියෝගය නිකුත්කොට මසක් ඇතුලත තවත් වරක් සේවකයකුට අභියාචනා කළ හැකි බව දක්වා තිබේ. ඒ සේවකයා විසින් පවරන ලද නඩු විභාගයකට අදාළවය.

එහෙත් මෙහිදී නඩු තීන්දුව ලබා දී ඇත්තේ මණ්ඩලය හෙවත් දෙවන පාර්ශ්වය සේවකයාට එරෙහිව කරන ලද පැමිණිල්ලකට අනුව පවරන නඩුවකින් සේවකයා නිදහස් කර තිබීමකි. ව්‍යවස්ථාවේ දක්වා ඇති කාල රාමුව තුළ සේවකයා එකී නඩු තීන්දුව ඉදිරිපත්කොට තමා සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා අභියාචනය කර ඇත.

එවැන්නක් සමාලෝචනය කර බැලීම සඳහා දෙවන පාර්ශ්වයට පැවරෙන වගකීම වඩාත් ප්‍රබල වුවද දෙවන පාර්ශ්වය එම වගකීම ඉටු කිරීම මෙහිදී පැහැර හැර ඇත.

ලංකා ගමනා ගමන මණ්ඩලය විශාල සේවක සංඛ්‍යාවක් සේවය කරන කාර්ය බහුල ආයතනයක් වීම වැනි කරුණු දෙවන පාර්ශ්වය දක්වා ඇතද එම අභියාචන ලිපිය නොසළකා හැරීම තුළින් සේවකයාට සිදුව ඇති හානිය වළකා ලන්නට එවන් සාධක සමත් නොවේ.

මෙම බරපතල හිදැස බේරුම්කරණ නඩු විභාගය හමුවේ දෙවන පාර්ශ්වයට පැහැදිලි කර දෙන ලදින් කිසියම් බේරුම්කරණ සමථයකට පැමිණීමට එකඟත්වය පළකරන ලදී. ඒ අනුව සාධාරණ සමථ ඉල්ලීමක් ඉදිරි නඩු වාරයට පෙර ඉදිරිපත් කරන ලෙස විනිශ්චය සභාව පළමු පාර්ශ්වය වෙත දන්වා සිටියේය.

ඒ අනුව පළමු පාර්ශ්වය ඉදිරිපත්කරන ලද සමථ යෝජනාව 2023.10.26 දින පැවති විභාගය හමුවේ ප්‍රකාශ කරන ලදී. එහි දක්වා තිබුනේ තම වැඩ තහනම් කරන ලද දින සිට හිඟ වැටුප් ගෙවීමකින් තොරව සේවයේ පිහිටුවීමට ලංකා ගමනාගමන මණ්ඩලය එකඟ වන්නේ නම් තම නඩුව ඉදිරියට ගෙනයාමට අවශ්‍ය නොවන බවය.

දෙවන පාර්ශ්වය ඊට ප්‍රතිචාර දක්වමින් එම යෝජනාව පිළිගැනීමට ඇති එකඟතාවය විනිශ්චය සභාව හමුවේ පළකරන ලදී.

ප්‍රදානය

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ අංක IR/COM/04/2020/208 සහ 2023 අප්‍රේල් 18 දිනැති යොමුවෙන් සිදුකර ඇති විමසුම නිරීක්ෂණය කරමින් එල්. චේතුක සමන්ත යන අය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 111 පෙළ විදුලි කාර්මිකයෙකු වශයෙන් කොග්ගල ඩිපෝවේ සේවය කරමින් සිටියදී 2014.02.09 දින ඇති වූ සිද්ධියක් පදනම් කරගෙන පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව සේවයෙන් පහ කළද එම කරුණු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු විභාගයෙන් අනතුරුව නිදොස් කිරීම හේතුවෙන් සේවය අවසන් කරමින් ලබා දී ඇති දඬුවම මගින් එල්. චේතුක සමන්ත යන අයට අසාධාරණයක් සිදුව ඇති බවට නිගමනය කරමි.

විනිශ්චය සභාවට ඉදිරිපත්වූ සමථ යෝජනාව සැළකිල්ලට ගෙන පළමු පාර්ශ්වකරුගේ සේවය අත්හිටුවන ලද 2014.03.01 දින සිට බල පවත්වන පරිදි හිඟ වැටුප් ගෙවීමකින් තොරව එදින ලැබූ වැටුප මත ඔහු සේවයේ නිරතව සිටින ලද කොග්ගල ඩිපෝවේ යළි සේවයේ පිහිටුවන ලෙසත් එසේ සේවයට කැඳවන විධිමත් ලිපිය සම්මුතිගත වූ පරිදි 2023.11.15 දිනට පෙර පළමු පාර්ශ්වය අතට පත්කරන්නට දෙවන පාර්ශ්වය කටයුතු කළ යුතු බවටත් සේවය තහනම් කළ වසරේ සිට ඉදිරියට වාර්ෂික වැටුප් වර්ධක ගණනය කොට තත්‍ය වැටුප් පියවරේ පිහිටුවා සේවයේ පිහිටුවන දින සිට වැටුප් ගෙවිය යුතු බවටත් හිඟ වැටුප් වර්ධක ලබා දෙන හෙයින් සිද්ධිගත කාල පරිච්ඡේදය ඔහුගේ රාජකාරි සේවා කාලය ගණනය කිරීමේදී අදාළ කර ගත යුතු බවටත් තහංචි පැනවීමකින් හෝ වෙන් කොට සැළකීමකින් තොරව ගමනාගමන මණ්ඩලයේ සාමාන්‍ය සේවකයකුට හිමි සියළු සේවා වරප්‍රසාද නැවත සේවයේ පිහිටුවන පළමු පාර්ශ්වකරු වෙත දෙවන පාර්ශ්වකරු වන ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් හිමි කර දිය යුතු බවටත් තීරණය කරමි. එමෙන්ම මෙම ප්‍රදානය *ගැසට් ගත* කිරීමෙන් මසක් ඇතුළත සමථය ක්‍රියාත්මක කිරීම ගාල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තහවුරු කළ යුතුය.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තවදුරටත් ප්‍රකාශ කරමි.

සිරි සිංගප්පුලි(LLB),
බේරුම්කරු,

2023 නොවැම්බර් මස 01 දින දීය.

EOG 12 - 0344

මගේ අංකය: IR/COM/03/H/2014/98(උප).

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.09.17 දිනැති හා අංක 2141/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.08.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හාලිඇල, බෙරාමඩ, කිරවානා උල්පත ලිපිනයෙහි පදිංචි ඩී. එම්. ලාල් වසන්ත කුමාර මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A/94/2019 හා 2023.11.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

*නඩු අංකය:* A/94/2019.
IR/COM/03/H/2014/98(උප).

ඩී. එම්. ලාල්. වසන්ත කුමාර මයා,
කිරිවානා උල්පත,
බොරමඩ,
හාලිඇල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 දරන හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2019.08.26 දාතමින් මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් 2019 අගෝස්තු 22 වන දින ගොණු කර ඇති ලේඛනය අනුව ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බදුල්ල ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම පරීක්ෂකවරයෙකු ලෙස සේවය කළ ඩී. එම්. ලාල් වසන්ත කුමාර මහතා දණිහිසේ ඇතිවූ ආබාධයක් හේතුවෙන් රෝහලේ නේවාසිකව ප්‍රථිකාර ලැබූ බවත්, එම වෛද්‍ය සහතිකය ඉදිරිපත් කළ බවත්, අසනීප බව දැන් වූ බවත් කරන ප්‍රකාශය අනුව ඩී. එල්. ලාල් වසන්ත කුමාර මහතා සේවය හැර ගිය අයෙකු ලෙස ආයතනය කටයුතු කිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේනම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ"

ඉල්ලුම්කරු 2019.09.28 දා තමින් සිය විස්තර ප්‍රකාශය පැ 1 සිට පැ 12 දක්වා වු ලේඛන සමග ඉදිරිපත් කර ඇත. ඔහු එමගින් අයැද ඇත්තේ,

i. 2013 අගෝස්තු මාසයේ සිට ඉන් පසුව වැඩි වූ වැටුප් වැඩි වීම සමග හිග වැටුප් සහිතව සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම.

ii. 2013 වර්ෂයේ සිට කම්කරු ආරවුල් පැමිණිලි විභාගය සඳහා වැය වූ මුදල් හා කාලය සඳහා රුපියල් ලක්ෂයක වන්දි මුදලක් ලබා දීම.

iii. නියමිත උසස්වීම් ලබා දෙන ලෙස නිර්දේශයක් ලබා දීම.

දෙවන පාර්ශ්වය 2019.10.30 දාතමින් විස්තර ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම් එක්ව හා වෙන්ව ප්‍රතික්ෂේප කරමින් මූලික විරෝධතාවයක් ද ඉදිරිපත් කර ඇත.

ඒ මගින් දෙවන පාර්ශ්වය ඉල්ලා ඇත්තේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම මුල් අවස්ථාවේදීම නිශ්ප්‍රභා කරන ලෙසය.

දෙපාර්ශ්වය විසින් විස්තර ප්‍රකාශ ගොණු කිරීමෙන් පසු 2020.09.04 දින මෙම කරුණු විමසීම සඳහා කැදවන ලදී. එදින ඉල්ලුම්කරු ඔහු වෙනුවෙන් නියෝජිත එම්.කේ.හේමපාල මහතාද දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ නිසල් ජේ. එස්. ප්‍රනාන්දු මහතාද පෙනී සිටින ලද අතර දෙවන පාර්ශ්වය මූලික විරෝධතාවක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම විභාග කිරීමට බේරුම්කරණයට බලයක් නොමැති බවත් එම නිසා එම ඉල්ලීම මුල් අවස්ථාවේදීම නිශ්ප්‍රභා කළ යුතු බවත්ය. ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටියේ දෙපාර්ශ්වය අතර කාර්මික ආරවුලක් තිබෙන බව තීරණය කර කම්කරු කොමසාරිස්වරයා එම ආරාවුල බේරුම්කරණ අංශය වෙත යොමු කර ඇති බවත් ඒ අනුව එම ආරාවුල විමසීමකට ලක් කර ඉල්ලුම්කරුට සහනයක් ලබා දෙන ලෙසත්ය.

ඒ අනුව මූලික විරෝධතාවය පිළිබඳව ලිඛිත දේශනා ඉදිරිපත් කිරීමට දෙපාර්ශ්වයට අවස්ථාව ලබා දෙන ලදී. එම ලිඛිත දේශනා සඳහා සළකා බලා 2021.02.19 වන දින නියෝගය ප්‍රකාශයට පත් කරමින් අදාළ කරුණ පිළිබඳව සාක්ෂි විමසීමට පෙර ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කිරීමෙන් ඉල්ලුම්කරුට සාධාරණයක් ඉටු නොවන නිසා දෙවන පාර්ශ්වයෙන් මූලික විරෝධය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කළෙමි.

සිය සාක්ෂිය දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කරු දැනුම් දෙන ලද අතර ඉල්ලුම්කරු සිය මූලික සාක්ෂි අඩංගු දිවුරුම් ප්‍රකාශය A1 සිට A13 දක්වා වූ ලේඛන ද සමග ගොණු කරන ලදී.

2022.03.04 දින මෙම කරුණ විමසීමට ගන්නා ලද අතර එදින ඉල්ලුම්කරු ද ඔහු වෙනුවෙන් නියෝජිත එම්. කේ. හේමපාල මහතාද දෙවන පාර්ශ්වය වෙනුවෙන් දිල්කි නිමේශා මහත්මිය සමග නීතිඥ ගංගානි උක්වත්තගේ මහත්මියද පෙනී සිටියහ. එදින ඉල්ලුම්කරු මූලික සාක්ෂිය ලබා දෙමින් A1 සිට A13 දක්වා ලේඛන ලකුණු කරන ලදි.

දෙවන පාර්ශ්වය කියා සිටියේ A10, A10 (B), A10 (C), A12, A13 ලේඛන ඔප්පු කිරීමේ භාරයට යටත් කර භාර ගන්නා ලෙසයි. එසේම ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර නොමැති ලේඛනයක් ලකුණු කිරීමට එම පාර්ශ්වය ඉල්ලා සිටින ලද අතර ඊට දෙවන පාර්ශ්වය විරුද්ධ විය. ලකුණු කිරීමට ඉල්ලා සිටින ලද ලිපිය ශ්‍රී ලංගම බදුල්ල කාර්යාලයේ විනය නිලධාරීගේ ලිපියක් බව පෙනීගිය හෙයින් එම ලිපිය අදාළ කර ගත හැකිද යන්න පසුව සලකා බැලීමේ අරමුණින් එය A14 ලෙස සලකුණු කිරීමට අවසර දෙන ලදී. 2022.09.22 දින දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ තූර්යා රොබට්ස් මහත්මිය ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී.

ඉල්ලුම්කරු සාක්ෂි දී අවසන් වීමෙන් පසු 2022.12.02 ක දින ඉල්ලුම්කරු වෙනුවෙන් විශ්‍රාමික වෘත්තීය සමිති නිලධාරියෙකු වන වයි. එම්. උපසේන මහතා සාක්ෂි ලබා දුන් අතර ඔහුගේ සාක්ෂිය දෙවන පාර්ශ්වයේ හරස් ප්‍රශ්න වලට භාජනය විය. ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි කැදවීම අවසන් වීමෙන් පසු 2023.01.20 දින දෙවන පාර්ශ්වය සාක්ෂි ලබා දීම ආරම්භ කරන ලද අතර මුලින්ම කොළඹ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර එල්. එම්.ප්‍රසන්න ප්‍රියදර්ශණ මහතා සාක්ෂි ලබා දුනි. එම සාක්ෂියේදී R7, R7 ඒ, R7බී, R8, R9, R10. R11, R12 යන ලේඛන ද ලකුණු කරන ලදී. පළමු පාර්ශ්වය වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම කරන ලද අතර 2023.05.19 දින දෙවන පාර්ශ්වය වෙනුවෙන් බදුල්ල ප්‍රාදේශීය කාර්‍යාලයේ පුද්ගලික ලිපි ගොණු භාර නිලධාරිනී එන්. සිතුමිනි මහත්මිය සාක්ෂි ලබා දෙන ලදී. එම සාක්ෂියේදී ඉල්ලුම්කරු නොදන්වා සේවයට වාර්තා නොකිරීම, නිවාඩු අවලංගු කර තිබියදී සේවයට වාර්තා නොකිරීම ආදී වරද වලට අදාල චෝදනා පත්‍ර, දඩුවම් ලබා දී ඇති බව තහවුරු කරන ලේඛන රාශියක් ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

සාක්ෂි කැඳවීම අවසන් කිරීමෙන් පසු දෙපාර්ශ්වයට ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලද අතර ඉදිරිපත් වූ සාක්ෂිද, ලේඛන ද, ලිඛිත දේශනද සලකා බලන ලදී. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ මුලින්ම කරුණු දක්වා ඇත්තේ මෙම ආරාවුල බේරුම්කරණය කිරීමට අධිකරණ බලයක් නොමැති බව තහවුරු කිරීම සඳහාය. මෙම විමසීම ආරම්භ වූ

අවස්ථාවේදී දෙවන පාර්ශ්වයේ අධිකරණ බලය සම්බන්ධයෙන් මූලික විරෝධතාවක් ඉදිරිපත් කරන ලද අතර එම කරුණට අදාලව ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදී. අනතුරුව මා තීරණය කරන ලද්දේ සාක්ෂි විමසීමට පෙර ඉල්ලීම නිෂ්ප්‍රභා කිරීම මගින් ඉල්ලුම්කරුට අගතියක් සිදුවන නිසා මූලික විරෝධය ප්‍රතික්ෂේප කිරීමටත් සාක්ෂි කැඳවීමටත් ය. අධිකරණ බලය පිළිබඳව දැනටමත් තීරණයක් ලබාදී ඇති තත්වයක් තුල දෙවන පාර්ශ්වයේ ලිඛිත දේශනයෙන් ඒ පිළිබඳව දිගින් දිගටම කරුණු දක්වා තිබුන ද ඒ කෙරේ අවධානය යොමු නොකළෙමි.

එසේම දෙවන පාර්ශ්වය සිය සාක්ෂි වලදී R1 සිට R103 දක්වා ලේඛන ලකුණු කරන ලද අතර එම ලේඛන අතරින් R13 සිට R103 දක්වා වූ ලේඛන ඉල්ලුම්කරුගේ පෙර වැරදි වලට අදාළ ලේඛනයන් ය. එම ලේඛන ඉල්ලුම්කරු නොදන්වා සේවයට නොපැමිණීම, නියමිත වෙලාවට පෙර සේවයෙන් බැහැර යාම, පඩි රහිත නිවාඩු ලබා ගැනීම ආදී වැරදි සම්බන්ධයෙන් ඔහුට ලබා දෙන චෝදනා පත්‍ර දඬුවම් තහවුරු කෙරෙන ලේඛනයන් ය. 2014 අගෝස්තු 27 වන දින වන විට ඉල්ලුම්කරු ශ්‍රී ලංගම සේවකයෙකි. මෙම ආරවුලට මුල් වූ කරුණ වන්නේ ඉල්ලුම්කරු වන ඩී. එම්. ලාල් වසන්ත මහතා සේවය හැර ගිය අයෙකු ලෙස තීරණය කිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේද යන්නයි. එම කරුණු තීරණය කිරීමේදී එම සිද්ධියට අදාළ සාක්ෂි ලේඛන මිස ඉල්ලුම්කරුගේ පෙර වැරදි ඒ පිළිබඳ සාක්ෂි හා ලිඛිත දේශනයෙන් ඒ සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු අදාළ කර නොගත්තෙමි. මෙම සිද්ධියට අදාල සාක්ෂි මගින් ඉල්ලුම්කරු ශ්‍රී ලංගම විනය නීති සංග්‍රහය උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බව තහවුරු වුවහොත් එකී පෙර වැරදි පිළිබඳව අවධානය යොමු කිරීමට තීරණය කළෙමි.

<u>සිද්ධියට අදාළව ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු</u>

- ශ්‍රී ලංගම බදුල්ල ප්‍රාදේශීය කාර්යාලයේ මාර්ග පරීක්ෂක තනතුර දරමින් සිටියදී දණහිසේ ඇති වූ රෝගාබාධයක් හේතුවෙන් 2013.08.27 දින සිට ගලඋඩ රෝහලට ඇතුලත් වී ප්‍රථිකාර ලැබූ බව
- එසේ ප්‍රථිකාර ලබමින් සිටියදී රෝහලේ නැවතී ප්‍රථිකාර ලබන නිසා නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා කාර්යභාර නිලධාරි ජංගම අංශය බදුල්ල ඩිපෝව වෙත විදුලි පුවතක් යවන ලද බව
- ගලඋඩ රෝහලෙන් බදුල්ල රෝහලට මාරු කර යවන ලදුව 2013.08.30 දින දක්වා එම රෝහලේදී ප්‍රතිකාර ලැබූ බව
- 2013.09.06 දින ආයුර්වේද වෛද්‍යවරියක් හමුවීමට ගොස් ප්‍රථිකාර ලබාගත් බව
- 2013.09.09 දා තමින් අසනීපයට තව දුරටත් ප්‍රථිකාර ලබන බවත් නිවාඩු ලබා දෙන ලෙසත් ඉල්ලා වෙනත් පුද්ගලයෙකු අත ලිපියක් යවන ලද බව,
- දෙවන පාර්ශ්වය විසින් එවන ලද නොදන්වා සේවයට නොපැමිණීමට අදාළව 2013.09.16 දින දරන ලිපිය ලැබුනේ 2013.09.24 දින බව
- 2013.09.26 දින සේවයට වාර්තා කිරීමට ගිය විට ඊට ඉඩ ලබා නොදුන් බව

<u>දෙවන පාර්ශ්වය විසින් සඳහන් කරන ලද කරුණු</u>

- ඉල්ලුම්කරු 2013.08.27 වන දින සිට නොදන්වා සේවයට වාර්තා නොකළ බවත් නොපැමිණීමට හේතු දක්වා නිවාඩු අනුමත කර නොගත් බව
- 2013.09.06 දින පිළිතුරට මුදල් බදින ලද විදුලි පුවතක් මගින් සේවයට පැමිණෙන ලෙසත් නොපැමිණීමට හේතු දක්වන ලෙසත් ඉල්ලුම්කරුට දන්වා යවන ලද බව වහාම සේවයට වාර්තා කරන ලෙසත් එසේ සේවයට වාර්තා කිරීමට නොහැකිවීමට හේතු ඇතිනම් හේතු ඉදිරිපත් කරන ලෙස එම විදුලි පුවත මගින් ඉල්ලුම්කරුට දන්වා යැවුවද ඊට පිළිතුරක් නොඑවන ලද බව,
- 2013.09.17 දා තමින් ඉල්ලුම්කරුට ලිපියක් යැවීම, එම ලිපියේ 2013.08.27 දින සිට සේවයට වාර්ථා කර නොමැති බව, නොපැමිණීමට හේතු දක්වා නිවාඩු අනුමත කර ගැනීමට අපොහොසත් වී ඇති බව, සේවයට වාර්තා කරන ලෙසට 2013.09.06 දින පිළිතුරට මුදල් බදින ලද ලිපියක් යවන ලද බව, වහාම සේවයට වාර්තා කරන ලෙස හා එසේ වාර්තා නොකළහොත් සේවය අතහැර ගිය අයෙකු ලෙස සලකන බව
- 2013.08.27 දින සිට සේවයට වාර්තා නොකිරීම, එසේ සේවයට වාර්ථා කිරීමට නොහැකි වීම පිළිබඳ හේතු නොදැක්වීම, නිවාඩු අනුමත කර ගැනීමට අපොහොසත් වීම, ඉල්ලුම්කරු සේවය අතහැර ගිය අයෙකු ලෙස සළකා කටයුතු කරන ලද බවට 2013.09.24 දින ලිපියක් මගින් දන්වා යවන ලද බව

ඉදිරිපත් වූ සාක්ෂි මගින් පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු 2013.08.27 දින සිට සේවයට වාර්තා කර නොමැති අතර සේවයට වාර්තා කිරීමට ආයතනයට ගොස් ඇත්තේ 2013.09.26 දින දීය. එනම් සේවයට වාර්තා නොකර මාසයක පමණ කාලයක් ගත වූවාට පසුවය. ඉල්ලුම්කරු එම කාලය තුල අසනීප වී සිටි බව තහවුරු කිරීමට හා නිවාඩු ලබා ගැනීමට ප්‍රමාණවත් ලෙස පියවර ගෙන තිබේද යන කරුණ පිළිබඳ අවධානය යොමු කරමි. එම කාලය තුල නිවාඩු ඉල්ලා විදුලි පුවතක් යැවූ බව (A5) 2013.09.09 දින ඉල්ලුම්කරු ලියන ලද ලිපියක් වෙනත් කෙනෙකු අත යවන ලද බව 2013.08.27 දින ගලඋඩ රෝහලේද, 2013.08.30 දින දක්වා බදුල්ල රෝහලේද ප්‍රථිකාර ලැබූ බවට වෛද්‍ය සහතික දෙකක්ද 2013.09.06 දින ආයුර්වේද ප්‍රථිකාර ලබා ගැනීමට ගිය බවට වෛද්‍ය සහතිකයක් ද රැගෙන ආයතනයට ගොස් ඇත්තේ 2013.09.26 දින දීය. එම වෛද්‍ය සහතිකය මගින් ඉල්ලුම්කරු සේවයට නොපැමිණි කාලය ආවරණය වනවාද යන්න පිළිබඳව පසුව කරුණු දක්වමි.

ඉල්ලුම්කරුගේ වෛද්‍ය සහතික දෙවන පාර්ශවයේ අභියෝගයට ලක් කළද A7 ලෙස ලකුණු කරන ලද බදුල්ල රෝහලෙන් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකය පිළිබඳ අවධානය යොමු කරමි. එම වෛද්‍ය සහතිකයේ සඳහන් වන්නේ 2013.08.29 දින සිට 2013.09.05 දින දක්වා සේවයට නොපැමිණ සිටීමට නිර්දේශ කරන බවයි. එම වෛද්‍ය සහතිකය නිකුත් කරන ලද්දේ 2013.08.30 වන දින දීය. ඉල්ලුම්කරු 2013.09.05 දක්වා දින දක්වා එම රෝහලේ ප්‍රථිකාර ලැබූ බවක් එමගින් තහවුරු නොවේ. එමෙන්ම ඉල්ලුම්කරු 2013.09.06 දින හාලි ඇල ආයුර්වේද වෛද්‍යවරියක් හමු වීමට ගිය බව දැක්වෙන වෛද්‍ය සහතිකයක්ද ඉදිරිපත් කරන ලදී.

ඉල්ලුම්කරු ආයුර්වේද ප්‍රතිකාර සඳහා යොමු වන විට සේවයට වාර්තා නොකර දින 10ක් පමණ ගත වී ඇත. ඉල්ලුම්කරුට තිබී ඇත්තේ දණහිසේ ආබාධයක් මිස හෘදයාබාධයක්, අගාධයක් වැනි බරපතල රෝගී තත්වයක් නොවේ. ඉල්ලුම්කරු ආයුර්වේද ප්‍රථිකාර සඳහා යොමු වී ඇත්තේ 2013.09.06 දින දීය. 2013.08.30 දින සිට 2013.09.06 දින දක්වා දින 6 ක කාලය ගත කලේ කුමන ආකාරයකටද? ඒ කාලය තුල අදාළ ආයතනයට ගොස් නිවාඩු අනුමත කර නොගත්තේ ඇයිද යන්න ප්‍රශ්නය පැන නගී.

ඊළඟට ඉල්ලුම්කරු ඉදිරිපත් කරන ලද ආයුර්වේද වෛද්‍ය සහතිකය (A10) පිළිබඳව අවධානය යොමු කරමි. 2013.09.06 දින සිට නිකුත් කර ඇති එම වෛද්‍ය සහතිකයේ ඉල්ලුම්කරු ප්‍රථිකාර ලබන බවත් සඳහන් නොවේ. එහි සඳහන් වන්නේ 2013.09.06 වන දින සිට දින විස්සක් නිවාඩු නිර්දේශ කරන බවය. රෝගියෙකුට වෛද්‍ය සහතිකයක් නිකුත් කල යුතු වන්නේ යම්කිසි කාලයක් ප්‍රථිකාර ලැබීමෙන් පසුවය. මෙම වෛද්‍ය සහතිකයේ එවැන්නක් නොවන බව පැහැදිලිව පෙනී යන කරුණකි.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී සඳහන් කරන ලද්දේ 2013.09.09 දින නිවාඩු ඉල්ලා ලිපියක් උපසේන නමැති අයෙකු අත ආයතනයට යවන ලද බවය. එවැනි ලිපියක් ලැබුණ බව දෙවන පාර්ශවය ප්‍රතික්ෂේප කරන ලදී. එම ලිපියේ සඳහන් වන්නේ දකුණු පාදයේ ආබාධයක් නිසා තව දුරටත් ප්‍රථිකාර ලබා ගන්නා බැවින් අසනීප නිවාඩු ලබා දෙන ලෙසය. ලිපියේ මුල් පිටපත භාර ගකිම් යනුවෙන් යමෙකු අත්සන් යොදා ඇත. එම ලිපිය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු වෙනුවෙන් උපසේන නමැති අය සාක්ෂි ලබා දෙන ලදී. එම සාක්ෂියේදී ඔහු සඳහන් කරන ලද්දේ ඉල්ලුම්කරු බැලීමට ඔහුගේ නිවසට ගිය අවස්ථාවේ ඔහු මගෙන් උපදෙස් ඉල්ලා සිටියයා තව දුරටත් මොනවද කරන්න ඕන කියලා.තව දුරටත් ඔහුට වැඩට යන්න බැහැ කියලා. ඒ අනුව තමයි මේ ලියුම ලියලා මට භාර දීල කාර්යාලයට භාර දෙන්න කිව්වේ "ඒ වන විට ඉල්ලුම්කරු සේවයට වාර්තා නොකර දින 12ක් පමණ ගත වී ඇත".

නිවාඩු ලබා ගැනිම සම්බන්ධයෙන් අවබෝධයක් ඇති සේවකයෙකු හැටියට ඔහු කළ යුතු වන්නේ තවත් කෙනෙකු අත නිවාඩු ඉල්ලා ලිපියක් යැවීමද යන ප්‍රශ්නය පැන නගී. එම සාක්ෂියෙන්ද තහවුරු වන්නේ 2013.09.09 දින වන විට ඉල්ලුම්කරු නිවසේ සිටින ලද බවය. මෙයින් පැහැදිලිවම ඉල්ලුම්කරු නිවාඩු ලබා ගැනීමට විධිමත් උත්සාහයක් දරා නොමැති බවත් නොසැලකිළිමත් ලෙස කටයුතු කර ඇති බවත්ය. තවද දෙවන පාර්ශවය 2013.09.06 දින පිළිතුරට මුදල් බඳින ලද විදුලි පුවතක් ඉල්ලුම්කරුට යවා ඇත. එවැනි විදුලි පුවතක් නොලැබුන බව ඉල්ලුකම්කරු ප්‍රකාශ නොකරයි. එම විදුලි පුවතට ප්‍රතිචාර නොදැක්වීමෙන්ද පැහැදිලි වන්නේ ඔහු නොසැලකිලිමත් ලෙස කටයුතු කර ඇති බවය. එසේම 2013.09.16 දා නමින් ඉල්ලුම්කරුට යවා ඇති ලිපිය සඳහන් කර ඇත්තේ 2013.08.27 දින සිට සේවයට වාර්තා කර නොමැති බව, නොපැමිණීමට හේතු දක්වා නිවාඩු අනුමත කර ගැනීමට අපොහොසත් වී ඇති බව, සේවයට වාර්තා කරන ලෙස 2013.09.06 වන දින පිළිතුරට මුදල් බඳින ලද ලිපියක් එවන ලද බව, වහාම සේවයට වාර්තා කරන ලෙස, එසේ වාර්තා නොකලහොත් සේවය අතහැර ගිය අයෙකු ලෙස සළකන බව යන කරුණු අඩංගු විය. ඉල්ලුම්කරු ප්‍රකාශ කරන්නේ එම ලිපිය 2013.09.19 දින සඳහන් වුවත් එය තමාට ලැබුනේ 2013.09.24 දින දී බවය. ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලිපියක් දින 8 ක් පමණ ප්‍රමාද වී ලැබුනා යැයි කීම විශ්වාස කල නොහැක. කෙසේ වෙතත් ඉල්ලුම්කරු ප්‍රකාශ කරන ආකාරයට එම ලිපිය ලැබුනේ 2013.09.24 දින නම් එවැනි බරපතල කරුණු අඩංගු ලිපියක් ලැබුනවිට ඉල්ලුම්කරු ගත් ක්‍රියා මාර්ගය කුමක්ද? ඔහු ආයතනයට ගොස් ඇත්තේ 2013.09.26 වන දින එනම් එම ලිපිය ලැබී දින දෙකක් ගත් වුවාටත් පසුවය. එයින් ද පැහැදිලි වන්නේ ඉල්ලුම්කරුගේ නොසැලිකිලිමත් බවයි. 2013.09.16 දින ලිපියට ඉල්ලුම්කරු කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ නිසා සේවය අතහැර ගිය අයෙකු ලෙස සැලකෙන බව දැක්වෙන ලිපියක් 2013.09.24 වන දින ඉල්ලුම්කරුට යැවූ බව දෙවන පාර්ශවය ප්‍රකාශ කරයි. ඉල්ලුම්කරු සඳහන් කරන්නේ 2013.09.26 දින ආයතනට ගිය විට එවැනි ලිපියක් යවා ඇති බවත්, සේවයට වාර්තා කිරීමට ඉඩ දිය නොහැකි බවත් තමාට දැන්වූ බවය.

ශ්‍රී ලංගම විනය සංග්‍රහයේ 21 වන වගන්තිය (දෙවන පාර්ශවය එම වගන්තිය R7 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී) නොදන්වා සේවයට නොපැමිණීම සේවය අතහැර යාම යටතේ සඳහන් වන්නේ 21.1 කිසියම් හේතුවක් නොදන්වා දින තුනකට වැඩි කාලයක් සේවයට නොපැමිණීම සේවකයෙකු විසින් කරගෙන යනු ලැබුවහොත් සේවා ස්ථානයේ කාර්‍යභාර නිලධාරි විසින් අදාළ සේවකයාගේ

අන්තිමට දැනුම් දී ඇති පෞද්ගලික ලිපිනයට පිළිතුරට මුදල් බඳින ලද විදුලි පුවතක් යැවීමෙන් සේවයට පැමිණෙන ලෙස දැනුම් දිය යුතුය. ලිපිය තැපැල් කළ දින සිට වැඩ කරන දින 7 ක් ඇතුලත් සේවයට පැමිණිය යුතු බවත් එසේ නැතහොත් සේවයට නොපැමිණීමට හේතු දැන්විය යුතු බවත් මොහුට දැනුම් දී එසේ කිරීමට අපොහොසත් වුවහොත් සේවයට නොපැමිණි පළමු දින සිට සේවය අත් හැර ගිය අයෙකු ලෙස සලකන බව පෙන්වා දෙමින් සේවයට නොපැමිණි 6 වන දිනේදී හෝ නොපමාව ඊට පසු දිනකදී අන්තිමට දැනුම් දී ඇති පෞද්ගලික ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් යැවීය යුතුය.

සේවකයා නියම කරන ලද කාලය ඇතුලතදී සේවයට නොපැමිණියහොත් හෝ නොපැමිණීමට හේතු නොදක්වා සිටියහොත් පළමු ලිපිය තැපැල් කළ දිනයේ සිට 8 වන වැඩ කරන දිනයේදී හෝ ඊට පසු දිනකදී ඔහු සේවයට නොපැමිණීමට හේතු නොදන්වා සිටිය හොත් පළමු ලිපිය තැපැල් කළ දිනයේ සිට 8 වන වැඩ කරන දිනයේදී හෝ ඊට පසු දිනකදී ඔහු සේවයට නොපැමිණි පළමු දිනයේ සිට සේවය අතහැර ගිය අයෙකු ලෙස සළකා ඇති බව දන්වා අවසාන වශයෙන් ලිපියක් ලියාපදිංචි තැපෑලෙන් අන්තිමට දැනුම් දී ඇති ඔහුගේ පෞද්ගලික ලිපිනයට යැවිය යුතුය".

දෙවන පාර්ශ්වය ළකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛන අනුව නිසි පරිදි ඉහත කී විධි විධාන අනුව පියවර ගෙන ඇති බව තහවුරු වේ. ඉල්ලුම්කරු නිවාඩු ඉල්ලා විදුලි පුවතක් යැවීම හා තවත් පුද්ගලයෙකු අත ලිපියක් යැවීම ඉහත කී වගන්තියේ විධි විධාන වලට ප්‍රතිචාර දැක්වීමක් හැටියට සැලකිය නොහැක. විශේෂයෙන් පිළිතුරට මුදල් බඳන ලද විදුලි පුවතට ප්‍රතිචාර නොදැක්වීම මගින් ඉල්ලුම්කරු බරපතල ලෙස එම විධි විධානයන් උල්ලංඝනය කර ඇත. අනුව ශ්‍රී ලංගම විනය නීති සංග්‍රහය අනුව ඉල්ලුම්කරු සේවය අතහැර ගිය අයෙකු ලෙස තීරණ කිරීම සාධාරණ බව තීරණය කරමි.

ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරමි. තවද මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව ප්‍රකාශ කරමි.

නිතීඥ සරත් ලියනගේ,
බේරුම්කරු,

2023 නොවැම්බර් මස 06 වැනි දින.

EOG 12 - 0345

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.